


## ශ්‍රී ලාංකික ජනතාවගේ සහ දේශයේ සෞභාග්‍ය වෙනුවෙන් කැප වී සිටින අප සමග හවුල්කරුවකු වන්නට ඔබත් කැමතිද?

**දිවයින පුරා ශාඛා 272 ක ජාලයකින් යුත් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රාජ්‍ය සංවර්ධන බැංකුව වන ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ පහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් සහිත ප්‍රතිඵල අභිමුඛ කාර්යශූර පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

# සහකාර කළමනාකරු - අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශය

**රැකියා ස්ථානය : අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් අංශය - ප්‍රධාන කාර්යාලය**

**මූලික සුදුසුකම් :**

- ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වීම. නීතිවේදී උපාධියක් (LLB) සහිත වීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- සිංහල හා ඉංග්‍රීසි භාෂා ද්විත්වයෙන්ම නොතාරිස් බලපත්‍ර ලබාගෙන තිබීම.
- සමාගම් ලේකම් ලියාපදිංචි සහතිකය සහිත වීම.
- රජයේ හෝ පුද්ගලික බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක නීති / අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් කටයුතුවල අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද ලබා තිබිය යුතුය.
- ආයතනික යහපාලනය, නීතිමය ලියකියවිලි සැකැස්ම සහ නියාමන රාමුව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය.
- පරිගනක දැනුම තිබිය යුතුවේ.
- ඉංග්‍රීසි භාෂාමය නිපුණතාවය තිබිය යුතුය.
- වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

# සහකාර කළමනාකරු - නීති

**රැකියා ස්ථානය : නීති අංශය - ප්‍රධාන කාර්යාලය**

**ප්‍රධාන වගකීම් :**

- ණය උකස්කර ඔප්පු ලියා සහතික කිරීම සහ බැංකුව වෙනුවෙන් අනෙකුත් නෛතික ලේඛන සකස් කිරීම සහ සහතික කිරීම.
- නෛතික කාරණා සහ අධිකරණයේ නඩු සම්බන්ධයෙන් බැංකුවේ නිලධාරීන් සමග සම්බන්ධීකරණය කරමින් කටයුතු කිරීම.
- කළමනාකාරීත්වය විසින් යොමු කරනු ලබන කාරණා වලට අදාළව ජ්‍යෙෂ්ඨ නීතිඥවරුන් සහ මණ්ඩලයේ නීතිඥවරුන් (Panel Lawyers) සමග උපදේශන සාකච්ඡා පැවැත්වීම.
- පැමිණිලි, දිවුරුම් ප්‍රකාශ සහ පෙත්සම් කෙටුම්පත් කිරීම, අදාළ අධිකරණවල නඩු පැවරීම සහ නඩු සඳහා අධිකරණයේ පෙනී සිටීම.
- අනෙකුත් සියලුම නෛතික කටයුතු

**මූලික සුදුසුකම් :**

- ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥවරයෙකු වීම සහ ප්‍රසිද්ධ නොතාරිස් ධූරය දැරීම. නීතිවේදී උපාධියක් (LLB) සහිතවීම විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

  (ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධි සුදුසුකම හෝ බැංකු/ මූල්‍ය අංශයේ වෘත්තීය විභාග වලින් සමත් වීම අමතර සුදුසුකමක් වේ.)

  **සහ**

  නීතිඥ සහ නොතාරිස් කටයුතු වල අවම වශයෙන් වසර 2ක පළපුරුද්ද හෝ රජයේ හෝ පුද්ගලික ආයතනයක/ නීති ආයතනයක නීති කටයුතුවල වසර 2 ක අවම පළපුරුද්ද ලබා තිබිය යුතුය. බැංකුවක හෝ පිළිගත් මූල්‍ය ආයතනයක පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වේ.
- තෝරා ගත් අයදුම්කරුවන් සතුව අදාළ අධිකරණ කලාපය තුළ භාෂා ද්විත්වයෙන්ම (සිංහල සහ ඉංග්‍රීසි) කටයුතු කිරීමේ හැකියාව සහිත නොතාරිස් බලපත්‍ර ලබා තිබිය යුතු වේ.
- පරිගනක දැනුම තිබිය යුතු වේ.
- වයස අවුරුදු 40 ට අඩු විය යුතුයි.

**වැටුප :**

තෝරාගන්නා ලද අයදුම්කරුවන් ආකර්ෂණීය වැටුපකට හිමිකම් කියනු ලබයි.

**අයදුම් කළ යුතු ආකාරය :**

සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ විමසීම් තොරතුරු ද සහිතව විෂය (Subject) තීරයේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර **2026 පෙබරවාරි 10 දින** හෝ ඊට පෙර **careers@rdb.lk** ඊමේල් ලිපිනයට යොමු කරන්න.

ඉහත සඳහන් කරන ලද සුදුසුකම් සපුරා ලීමට අසමත්වන හෝ වැරදි තොරතුරු ඇතුළත් අයදුම්පත් මෙම බඳවාගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවකදී කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරාගත් අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ සහ මෙම බඳවාගැනීම කල් තැබීම හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුය.

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
பிரதேச அபிவிருத்தி வங்கி
RDB Regional Development Bank

ප්‍රධාන මානව සම්පත් නිලධාරී,
ප්‍රාදේශීය සංවර්ධන බැංකුව,
අංක 933, නුවර පාර, වෙදමුල්ල, කැළණිය.
0112 03 54 54 | www.rdb.lk